ජාතික තාක්ෂණ ශාඛාව 775


# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/02/01(11) | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2021.09. 28

චක්‍රලේඛ අංක : 18/2021


Information & Communication Technology Branch
0 6 OCT 2021
Ministry of Education "Isurupaya", Battaramulla.


පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පරිවේණාධිපතිවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත.

**2020 - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා පෙනී සිටි සිසුන් අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට ඇතුළත් කිරීම**

අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරන චක්‍රලේඛයට හා එයට අදාළ ව නිකුත් කර ඇති චක්‍රලේඛ සංශෝධනවලට අමතර වශයෙනි.

2.0 මෙම චක්‍රලේඛයේ උපදෙස් 2020 - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා පෙනී සිටි සිසුන් අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා **පමණක්** අදාළ වේ.

3.0 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය - 2020 ප්‍රතිඵල අනුව ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා පෙනී සිටි සිසුන් 12 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා අවම සුදුසුකම් ගළපා ගත යුතු ආකාරය :

| | අවශ්‍ය අවම සුදුසුකම් | සුදුසුකම් ගළපා ගත යුතු ආකාරය |
|---|---|---|
| අ. | මාධ්‍යභාෂාව සහ ගණිතය විෂය සහිත ව විෂයන් පහකින් සම්මාන සාමර්ථ්‍ය 02ක් සහිත ව සමත් වීම. | අවම සුදුසුකම් සපුරා ඇත. |
| ආ. | මාධ්‍යභාෂාව හෝ ගණිතය ඇතුළත් ව විෂයන් හතරකින් සම්මාන සාමර්ථ්‍ය 02ක් සහිත ව සමත් වීම. | ඊළඟ ආසන්න වර්ෂයේ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී ම අසමත් වූ විෂය (මාධ්‍යභාෂාව හෝ ගණිතය විෂය) සම්පූර්ණ කර ගැනීමේ පදනම මත ඇතුළත් කර ගත හැකි ය. |
| ඇ. | ගණිතය විෂය අසමත් ව විෂයන් පහකින් සම්මාන සාමර්ථ්‍ය 02ක් සහිත ව සමත් වීම. | එළඹෙන වර්ෂ 02ක් ඇතුළත අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් වී ගණිතය විෂය සමත් වීමේ පදනම මත අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීම සඳහා ඇතුළත් කර ගත හැකි ය. |


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

3.1 ඉහත 3.0(අ) හි දැක්වෙන සුදුසුකම් යටතේ අවශ්‍ය වන සම්මාන සාමර්ථ්‍ය දෙකෙන් එකක් නොමැති අවස්ථාවක පමණක් 2020 - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ලිඛිත පරීක්ෂණයේ සාමාන්‍ය සාමර්ථ්‍යයක් ලබා එම විෂයට ම පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩ පිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතා මට්ටමක් ලබා ඇත්නම් එය එක් සම්මාන සාමර්ථ්‍යයක් ලෙස සලකනු ලැබේ. මෙය මාධ්‍ය භාෂාව හා ගණිතය යන විෂයන් සඳහා අදාළ නොවේ.

3.2 පාසල් සිසුවෙකු ලෙස මුල් ප්‍රයත්නයෙන් පසු ව දෙවන වර අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයක් සඳහා පෙනී සිටි සිසුවකුට ද ඉහත 3.1 හි දැක්වෙන පරිදි සුදුසුකම් සපුරා ගැනීම සඳහා මුල් ප්‍රයත්නයේ දී ලබා ගත් පාසල පදනම් කර ගත් තක්සේරුකරණ වැඩපිළිවෙළෙහි ප්‍රතිඵල යොදා ගත යුතු ය.

3.3 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා පෙනී සිටි සිසුන් අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට ඇතුළත් කිරීමේ දී විශිෂ්ට හෝ අධි සම්මාන අවශ්‍යතාව සඳහා ද ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා ලබා ඇති පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩපිළිවෙළෙහි නිපුණතා මට්ටම් අදාළ කරගත යුතු ය.

3.4 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) - 2020 විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයක් සඳහා පෙනී සිටි අපේක්ෂකයෙකු එම විෂය ඇතුළත් ව අ.පො.ස.(උසස් පෙළ) හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම් එම විෂය සඳහා පාසල පදනම් කරගත් තක්සේරුකරණය යටතේ සම්මාන හෝ ඊට ඉහළ නිපුණතා මට්ටමක් ලබා තිබිය යුතු ය. එසේ වුව ද පාසල පදනම් කරගත් තක්සේරුකරණ වැඩ සටහන යටතේ නිපුණතා මට්ටමක් සඳහන් නොවන අවස්ථාවක දී පමණක් ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය (පාසල් කටයුතු ශාඛාව) මගින් අනුමැතිය ලබා ගත යුතු ය.

3.5 අ.පො.ස.(සාමාන්‍ය පෙළ) - 2020 විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණ සහිත සෞන්දර්ය විෂයන් සඳහා පෙනී සිටි සිසුන් 2021 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) 12 ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමේ දී ඉහත උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කරන ලද අතිරේක විධිවිධානවලට අමතර ව උක්ත චක්‍රලේඛවල ඇතුළත් අනෙකුත් කරුණු සියල්ලම එලෙස ම බල පැවැත්වේ. මෙම චක්‍රලේඛයෙහි පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

මහාචාර්ය, කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
2. විගණකාධිපති
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්